# ක්‍රියාකාරකම් පත්‍රිකාව

# ගැණුම් ජ'නලය, විකුණුම් ජ'නලය හා පොදු ජ'නලය

- **නිවරැදි පිළිතුර තෝරන්න.**

1) ගැණුම් ජ'නලයේ ගණුදෙනු සටහන් කිරීම සඳහා උපයෝගී කරගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ,
   I. වව්චරය
   II. ලදුපත
   III. ඉන්වොයිසය
   IV. ජ'නල් වව්චරය

2) ගැණුම් ජ'නලයේ මුළු එකතුව ලෙජරයට පිටපත් කිරීමේ ද්විත්ව සටහන වන්නේ,
   I. ගැණුම් ගිණුම හර- මුදල් ගිණුම බැර
   II. ණය හිමි ගිණුම හර- ගැණුම් ගිණුම බැර
   III. ගැණුම් ගිණුම බැර- මුදල් ගිණුම හර
   IV. ගැණුම් ගිණුම හර- ණය හිමි ගිණුම බැර

3) උපයෝගී පොත් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
   I. ගැණුම් ජ'නලය, ලෙජරය හා මුදල් පොත
   II. ගැණුම් ජ'නලය, විකුණුම් ජ'නලය හා පොදු ජ'නලය
   III. විකුණුම් ජ'නලය, පොදු ජ'නලය හා ලෙජරය
   IV. විකුණුම් ජ'නලය, ලෙජරය හා මුදල් පොත

4) දර්ශන රු.50000ක් වටිනා යන්ත්‍රයක් ණයට ලබා ගන්නා ලදී.මෙය වාර්තා කිරීමට අදාල මූලික පොත වන්නේ,
   I. ගැණුම් ජ'නලය
   II. විකුණුම් ජ'නලය
   III. පොදු ජ'නලය
   IV. මුදල් පොත

5) පොදු ජ'නලය යනුවෙන් හැඳින්වෙන්නේ,
   I. ණයට විකිණීම සඳහා ගත් භාණ්ඩ සටහන් කරන මූලික පොතකි.
   II. වෙනත් මූලික පොතක නොලියන ගණුදෙනු සටහන් කරන පොතය.
   III. ව්‍යාපාරයේ බඩු තොග ණයට විකුණුම් සටහන් කරන මූලික පොතය.
   IV. මුදලින් සිදුවූ ගණුදෙනු සටහන් කරන මූලික පොතය.

අන්තර්ගතය - ආර්.එම්.ඒ.සිල්වා- ගුරු උපදේශක-හම්බන්තොට
සැකසුම - ඩී.එම්.එස්.ආර්.දිසානායක - ව/ම/ම/ ඇඹලේගොඩ ම.වි., නාගොල්ලාගම

- **පහත සඳහන් ප්‍රශ්න වලට අදාල පිළිතුර හිස්තැනෙහි සටහන් කරන්න.**

6) ණයට විකුණන ලද භාණ්ඩ පිළිබඳව පළමු වරට සටහන් කරන පොත .................... ජ'නලය ලෙස හැඳින්වේ.
7) නිශ්චිත කාලච්ඡේදයක් අවසානයේදී ගැණුම් ජ'නලයේ එකතුව ..................... ගිණුමට හර කරයි.
8) විකිණුම් ජ'නලයේ ගණුදෙනු සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ .................... යි.
9) ලෙජරයේ ඇති විකිණුම් ගිණුමට බැර කරනුයේ ....................... මුළු එකතුවයි.
10) මූලික පොත් වල සටහන් කරන ගණුදෙනුවලට අමතරව විවිධ ස්වරූපවල ගණුදෙනු සටහන් කරන පොත .......................... ය.
11) පොදු ජ'නලයේ ගණුදෙනු සටහන් කිරීමට අදාලකර ගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ ......................... ය.

**(ගැණුම් ජ'නලය, පොදු ජ'නලය, විකිණුම් ජ'නලය, ජ'නල වව්චරය, ගැණුම් ගිණුම හර, විකිණුම් ඉන්වොයිසය)**

12) පහත තීරුවෙන් මූලික පොත් දැක්වෙන අතර තීරුවෙන් ඒවාට අදාල ගණුදෙනු දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1) ගැණුම් ජ'නලය<br>2) විකුණුම් ජ'නලය<br>3) පොදු ජ'නලය | A- ගැළපුම් සටහන්<br>B- ව්‍යාපාරයේ භාණ්ඩ ණයට විකිණීමේදී ඒ පිළිබඳව ප්‍රථම වරට සටහන් කරන පොතය.<br>C- නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ගන්නා ලද භාණ්ඩ සටහන් කරන පොතය. |

X හා Y තීරු නිවරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර අදාල කාණ්ඩය වන්නේ,

I. 1-A, 2-B, 3-C
II. 1-C, 2-A, 3-B
III. 1-C, 2-B, 3-A
IV. 1-B, 2-A, 3-C
V.

13) ස්ථාවර වත්කම් ණයට ගැණුම් පිළිබඳව සටහන් කිරීම සඳහා උපකාර කර ගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ,

I. ඉන්වොයිසයයි.
II. ලදුපතයි.
III. ජ'නල් වව්චරයයි.
IV. වව්චරයයි.

අන්තර්ගතය - ආර්.එම්.ඒ.සිල්වා- ගුරු උපදේශක-හම්බන්තොට
සැකසුම - ඩී.එම්.එස්.ආර්.දිසානායක - ව/ම/ම/ ඇඹලේගොඩ ම.වි., නාගොල්ලාගම